

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල

SRI LANKA TOURISM DEVELOPMENT FUND

சுற்றுலா அபிவிருத்தி நிதியம்

# වාර්ෂික වාර්තාව
# ANNUAL REPORT
# வருடாந்த அறிக்கை
# 2020

SO SRI LANKA

ශ්‍රී ලංකා
සංචාරක සංවර්ධන අරමුදල

# වාර්ෂික වාර්තාව
# 2020

SO SRI LANKA





**ගරු ප්‍රසන්න රණතුංග**
සංචාරක අමාත්‍ය

ගරු අමාත්‍යතුමනි
**යොමුව: සංචාරක සංවර්ධන අරමුදල**

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23(1) වගන්තිය යටතේ සංචාරක සංවර්ධන අරමුදල ස්ථාපිත කර ඇති බව ඔබගේ කාරුණික අවධානය සඳහා යොමු කිරීමට කැමැත්තෙමි. මෙම අරමුදල සංචාරක කර්මාන්තයේ සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා යොදා ගත යුතු වේ. තවද, මෙම අරමුදලට මුදල් උපයා ගැනීම මෙන්ම බෙදා හැරීම සම්බන්ධ ක්‍රමවේදය ද මෙම පනත මගින් දක්වා ඇත.

2005 අංක 28 දරණ සංචාරක පනතේ 23 (2) වගන්තියට අනුව සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් අයකරනු ලබන සංචාරක අපගමන බද්දෙන් 1/3 ක ප්‍රමාණයක් (ඇ. ඩො. 5 කට සමාන ප්‍රමාණයක්) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ප්‍රේෂණය කරනු ලබයි.

තවද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාරිකයින්ගෙන් සංචාරක සංවර්ධන බද්ධ නමින් තවත් බද්දක් එකතු කරනු ලබයි.

සංචාරක සංවර්ධන අරමුදල 2005 අංක 38 දරණ සංචාරක පනතේ දක්වා ඇති ප්‍රතිශතයන්ට අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය හා ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය යන ආයතනයන් අතර බෙදා හරිනු ලබයි.

2019 වසර තුල සංචාරක සංවර්ධන අරමුදල ලෙස රු මිලියන 3,013.54 උපයා ගත් අතර 2020 වසර තුල එය රු. මිලියන 1,030.44 ක් ලෙස පෙන්නුම් කරයි. 2020 වසර තුල පැවති කොවිඩ් - 19 වසංගතය හේතු කොට ගෙන එම වසර තුල උපයා ගත් මුදල 2019 වසරට වඩා ආසන්න වශයෙන් බිලියන 2 කට හෝ 65% කට සමාන ප්‍රමාණයකින් අඩු වී ඇති බව පෙනේ.

2020 වසර තුලදී උක්ත අරමුදලට මුදල් උපයා ගත් හා බෙදා හැරී ආකාරය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ අඩංගු වේ.

ස්තූතියි,
මෙයට විශ්වාසී

අත්සන් කලේ,
**කිමාලි ප්‍රනාන්දු**
සභාපතිනී - ශ්‍රී ලංකා සංචරණය



## පටුන


A. හැඳින්වීම

B. සංචාරක සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශන (TDF)

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය/කාර්යසාධනය

C. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

D. ගිණුම්වලට අදාල සටහන්


### ප්‍රස්ථාර ලැයිස්තුව


වගුව 1 - ශ්‍රී.ලං.සං.ප්‍ර.කාර., ශ්‍රී.ලං.සං.සං.අ., ශ්‍රී.ලං.සං.හා.හෝ.ක.අ., සහ ශ්‍රී.ලං.සං.කා. අතර සං.සං.අ. බෙදා හරිනු ලබන ප්‍රතිශතය

ප්‍රස්ථාර 2 - ඉහත ආයතන අතර 2019 සහ 2020 වසර තුළ සං.සං.අ. බෙදා හරින ලද ප්‍රමාණය - රු: මිලියනවලින්


### භාවිතා කරන ලද කෙටි යෙදුම්

| | |
|---|---|
| EL | - සංචාරක අපගමන බදු |
| SLCB | - ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය |
| SLITHM | - ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය |
| SLTDA | - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය |
| SLTPB | - ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය |
| TDF | - සංචාරක සංවර්ධන අරමුදල |
| TDL | - සංචාරක සංවර්ධන බදු |



## A. හැඳින්වීම

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (1) වගන්තිය යටතේ ස්ථාපිත කර ඇති සංචාරක සංවර්ධන අරමුදල සංචාරක ව්‍යාපාරයේ සංවර්ධනය සහ සංචාරක ප්‍රවර්ධනය සඳහා යොදා ගත යුතු වේ. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් මෙම අරමුදල පාලනය හා මෙහෙයවීම සිදු කෙරේ.

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (2) වගන්තිය සහ 2003 අංක 25 දරණ මූල්‍ය පනතේ 2 (1) වගන්තිය ප්‍රකාරව සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් එකතු කරනු ලබන අපගමන බද්දෙන් 1/3 ක ප්‍රමාණයක් සංචාරක සංවර්ධන අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලබයි. තවද, 2003 අංක 25 දරණ මූල්‍ය පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සියළුම ලියාපදිංචි සංචාරක ව්‍යාපාරවලින් සංචාරක සංවර්ධන බද්ධ නමින් බද්ධක් අයකර සංචාරක සංවර්ධන අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලබයි. 2005 අංක 38 දරණ සංචාරක පනතේ 24 (8) වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන අරමුදලට බැර කරනු ලබන සියළුම මුදල් පහත දැක්වෙන පරිදි ආයතන අතර බෙදා හරිනු ලබයි.


අ) 2005 අංක 38 දරණ සංචාරක පනතේ 40 වැනි වගන්තිය ප්‍රකාරව 70% ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සඳහා

ආ) 2005 අංක 38 දරණ සංචාරක පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාරව 14% ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සඳහා.

ඇ) 2005 අංක 38 දරණ සංචාරක පනතේ 33 වැනි වගන්තිය ප්‍රකාරව 12% ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය සඳහා

ඈ) 2005 අංක 38 දරණ සංචාරක පනතේ 42 වැනි වගන්තිය ප්‍රකාරව 4% ක මුදලක් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සඳහා

වගුව - ඉහත කී ආයතන අතර සංචාරක සංවර්ධන අරමුදල බෙදාහරින ලද ප්‍රතිශතයන්.




2020 වසර තුළදී සංචාරක සංවර්ධන අරමුදලට ලද මුදල් හා එම මුදල් බෙදා හරින ලද ආකාරය පිළිබඳ විස්තර මෙම වාර්තාවේ අන්තර්ගත වේ.

## සංචාරක සංවර්ධන අරමුදල
2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | සටහන් අංකය | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල්වලට සමාන වත්කම් | 3 | 316,557,432 | 170,015,643 |
| වෙනත් ලැබිය යුතු දෑ | 4 | 240,366,762 | 120,391,056 |
| **මුළු වත්කම්** | | **556,924,194** | **290,406,699** |
| | | | |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ | 5 | 57,955,921 | 11,850,064 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | | 69,855,558 | 38,997,929 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | | 349,277,791 | 194,989,644 |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | | 59,876,193 | 33,426,796 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | | 19,958,731 | 11,142,265 |
| **මුළු වගකීම්** | | **556,924,194** | **290,406,699** |

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි පිටු අංක 13 සිට 16 දක්වා මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය අංගයක් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ඇතුලත් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

..............................................
**සම්පත් ගනේපලආරච්චි**
අධ්‍යක්ෂ/ මූල්‍ය කළමනාකරණ

| ..................................... | ..................................... | ..................................... |
|---|---|---|
| **කිමාලි ප්‍රනාන්දු** | **ධම්මිකා විජයසිංහ** | **එම්. ශාන්තිකුමාර්** |
| සභාපතිනී | අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික |



## සංචාරක සංවර්ධන අරමුදල
2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| | සටහන් අංකය | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| සංචාරක සංවර්ධන බදු සහ අපගමන බදු | 6 | 1,030,435,838 | 3,013,539,831 |
| වෙනත් ආදායම් | 7 | 6,855,193 | 22,643,312 |
| **මුළු ආදායම** | | **1,037,291,031** | **3,036,183,143** |
| **වියදම්** | | | |
| අරමුදල් පරිපාලන පිරිවැය | 8 | 3,568,709 | 5,061,956 |
| මූල්‍ය පිරිවැය | 9 | 504,786 | 107,307 |
| අරමුදල් බෙදාහැරීම | 10 | 1,030,121,231 | 3,031,013,880 |
| සංචාරක සංවර්ධන බද්දෙන් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද 0.5% ප්‍රමාණය | 11 | 3,096,305 | - |
| **මුළු වියදම** | | **1,037,291,031** | **3,036,183,143** |
| **කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌණතාවය)** | | | |
| | | | |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌණතාවය) | | **-** | **-** |

### හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

2003 අංක 25 දරණ මූල්‍ය පනත සහ 2005 අංක 38 දරණ සංචාරක පනතට අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමනාකරණය සහ පරිපාලනය සඳහා සංචාරක සංවර්ධන අරමුදල ස්ථාපිත කර ඇත. එබැවින් සංචාරක සංවර්ධන අරමුදල සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයක් සකස් කරනු නොලැබේ. අරමුදලේ සිදුවන ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස අරමුදල විසින් ලාභ හෝ අලාභ උපයනු නොලැබේ. 2005 අංක 38 දරණ සංචාරක පනතේ 24 (8) (අ) වගන්තිය මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි මුළු ශුද්ධ ආදායම ආයතන හතර අතර පහත දැක්වෙන ආකාරයට බෙදා හරිනු ලැබේ.

| | |
|---|---|
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) | 70% |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) | 14% |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) | 12% |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය (SLCB) | 04% |

**සංචාරක සංවර්ධන අරමුදල**
2020 දෙසැම්බර් 31 දිනට
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන් අංකය | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්හි මුදල් ප්‍රවාහය** | | | |
| **ලැබීම්** | | | |
| සංචාරක සංවර්ධන බදු සහ අපගමන බදු/ | 12 | 899,055,449 | 3,871,213,085 |
| වෙනත් ලැබීම් | | 212,385,589 | 64,463,131 |
| **ගෙවීම්** | | | |
| බෙදාහැරීම් | 13 | (809,709,592) | (4,129,128,767) |
| වෙනත් ගෙවීම් | | (155,189,670) | (60,083,224) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **146,541,776** | **(253,535,775)** |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | | |
| මුදල් හා මුදල් සමාන දෑහි ආරම්භක ශේෂය | | 170,015,656 | 423,551,431 |
| මුදල් හා මුදල් සමාන දෑහි අවසාන ශේෂය | | 316,557,432 | 170,015,656 |
| **මුදල් හා මුදල් සමාන දෑහි ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්)** | | **146,541,776** | **(253,535,775)** |



## ගිණුම්වලට අදාල සටහන්

**1. සංචාරක සංවර්ධන අරමුදල**

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23(I) වගන්තිය යටතේ "සංචාරක සංවර්ධන අරමුදල" නමින් අරමුදලක් ස්ථාපිත කර ඇත. මෙම අරමුදල සංචාරක ව්‍යාපාරයේ සංවර්ධනය හා ප්‍රවර්ධනය උදෙසා යෙදවිය යුතු අතර 2003 අංක 25 දරණ මුදල් පනත සහ 2005 අංක 38 දරණ සංචාරක පනතට අනුකූලව සංචාරක සංවර්ධන අරමුදල රැස් කිරීම සහ බෙදා හැරීම සිදු කළ යුතුය.

**2. ගිණුම්කරණ අවශ්‍යතා**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අරමුදලේ ගිණුම් සකස් කර ඇත.

**3. මුදල් හා මුදල් සමාන දෑ**

| | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| ලංකා බැංකු ගිණුම් අංක 7122882 | 263,032,364 | 149,933,995 |
| ලංකා බැංකු සෘජු තැන්පතු ගිණුම් අංක 73104820 | 53,525,068 | 20,081,647 |
| **එකතුව** | **316,557,432** | **170,015,643** |

**4. ලැබිය යුතු දෑ**

| | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| ලැබිය යුතු අපගමන බදු | 69,166,567 | - |
| ලැබිය යුතු සංචාරක සංවර්ධන බදු | 170,351,252 | 120,000,000 |
| ණයගැති - වෙනත් | 848,943 | 391,056 |
| **එකතුව** | **240,366,762** | **120,391,056** |

**5. ගෙවීම්**

| | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| සංචාරක සංවර්ධන අරමුදලේ අතුලත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අදාල ජංගම ගිණුම් | 1,638,865 | 1,399,779 |
| උපචිත වියදම් - පරිපාලන ගාස්තු | 2,521,883 | 1,245,082 |
| උපචිත වියදම් - විගණන ගාස්තු | 429,945 | 207,945 |
| උපචිත වියදම් - මුද්දර ගාස්තු | 84,475 | 52,975 |
| වෙනත් ජංගම වගකීම් | 51,933,332 | 7,317,473 |
| සංචාරක සංවර්ධන බද්දෙන් භාණ්ඩාගාරය වෙත 0.5% ක ප්‍රේෂණය | 1,347,219 | 1,626,609 |
| රඳවාගත් ඉපැයීම් | 202 | 202 |
| **එකතුව** | **57,955,921** | **11,850,064** |

## 6. බදු - අරමුදල් මූලාශ්‍ර

| | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| 6.1 අපගමන බදු | 489,503,510 | 2,089,294,245 |
| 6.2 සංචාරක සංවර්ධන බදු | 537,836,023 | 924,245,586 |
| 6.3 සංචාරක සංවර්ධන බද්දෙන් 0.5%ක එකතුව | 3,096,305 | - |
| **එකතුව** | **1,030,435,838** | **3,013,539,831** |

### 6.1 අපගමන බදු

සංචාරක පනතේ 23(2) වගන්තියට අනුව සමස්ථ අපගමන බදු අදායම ඇ. ඩො. 15 ක ප්‍රමාණයකින් 1/3 (ඇ. ඩෝ. 5 කට සමාන මුදලක්) ක ප්‍රමාණයක් සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවන ලදී.

| | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| මුදල් ලැබීම් | 420,336,942 | 2,089,294,245 |
| ලැබිය යුතු මුදල් | 69,166,568 | - |
| **මුළු අපගමන බදු** | **489,503,510** | **2,089,294,245** |

**විශේෂ සටහන**

**ලැබිය යුතු අපගමන බදු මුදල (2019)**

2019 සැප්තැම්බර් 15 වැනි දින සිට 2020 ජනවාරි 30 වැනි දින දක්වා බලපැවැත්වෙන පරිදි කලාපීය වාණිජ ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යාපනය (පලාලි) ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධනය සඳහා යෙදවීමට අමාත්‍ය මණ්ඩල තීරණ අංක 19/2797/123/110 අනුව අපගමන බද්දෙන් රුපියල් මිලියන 1,050ක මුදලක් රඳවාගෙන ඇත. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ඒ අනුව රඳවාගත් මුළු මුදල රු. මිලියන 1050ක් බව තහවුරු කරන ලදී.

### 6.2 සංචාරක සංවර්ධන බදු (TDL)

2003 අංක 25 දරණ මූල්‍ය පනතට අනුව සංචාරක ක්ෂේත්‍රයට අයත් සෑම ආයතනයක්ම සංචාරක සංවර්ධන බදු ගෙවිය යුතුය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරක සංවර්ධන අරමුදලට බදු එකතු කර එය සංචාරක සංවර්ධන අරමුදලට බැර කරනු ලබයි. 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ එකතු කරන ලද සංචාරක සංවර්ධන බදු ප්‍රමාණය රුපියල් මිලියන 367 කි. එසේම, 2020 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා රුපියල් මිලියන 170 ක ඇස්තමේන්තුවක් සකස් කර ඇත.



| | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| 2020 ජනවාරි-දෙසැම්බර් දක්වා බදු මුදල් | 354,847,132 | 708,815,904 |
| 2020 ඔක්තෝබර්-දෙසැම්බර් දක්වා ලැබිය යුතු බදු මුදල | 170,351,252 | 120,000,000 |
| 2019 ඔක්තෝබර් - දෙසැම්බර් දක්වා අධි වෙන්කිරීම් / ඌණ වෙන්කිරීම් | 12,738,706 | 95,833,496 |
| සංචාරක සංවර්ධන බදු ආපසු ගෙවීම් | (101,067) | (403,814 ) |
| **ජනවාරි-දෙසැම්බර් කාලසීමාව තුළ මුළු සංචාරක සංවර්ධන බදු මුදල** | **537,836,023** | **924,245,586** |

## 7. වෙනත් ආදායම්

අනෙකුත් ආදායම් ලෙස ගිණුම්ගතකොට ඇති වටිනාකම තුල මූලිකව අන්තර්ගත වන්නේ 2003 අංක 25 දරණ මූල්‍ය පනත ප්‍රකාරව නියමිත දිනට ගෙවීම් නොකල ලියාපදිංචි ආයතනයන්හි ප්‍රමාද ගෙවීම් මත අයකල පොලී ආදායම වේ.

| | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| බදු පමා කිරීමේ පොලී ආදායම් | 6,261,796 | 21,159,720 |
| 20% ක අධිභාරය | 593,398 | 1,483,330 |
| වර්ෂය සඳහා බදු පමා කිරීමේ පොලී ආදායම් | 6,855,193 | 22,643,049 |
| වෙනත් ආදායම් | - | 263 |
| **එකතුව** | **6,855,194** | **22,643,312** |

## 8. අරමුදල් පරිපාලන පිරිවැය

| | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| මුද්දර ගාස්තු | 31,500 | 74,400 |
| පරිපාලන වියදම් | 3,315,209 | 4,732,256 |
| විගණන ගාස්තු | 222,000 | 255,300 |
| **එකතුව** | **3,568,709** | **5,061,956** |

## 9. මූල්‍ය පිරිවැය

| | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| බැංකු ගාස්තු | 59,900 | 107,307 |
| එකතු කිරීමේ කොමිස් මුදල | 442,886 | - |
| සේවා ගාස්තු | 2,000 | - |
| **එකතුව** | **504,786** | **107,307** |

## 10. අරමුදල් බෙදා හැරීම්

2005 අංක 38 දරණ සංචාරක පනතේ 24(8) වගන්තිය ප්‍රකාරව අරමුදල් බෙදාහැරීම දීම සිදු කර ඇත.

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 144,216,972 | 424,341,943 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 721,084,862 | 2,121,709,716 |
| ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය | 123,614,548 | 363,721,666 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 41,204,849 | 121,240,555 |
| **එකතුව** | **1,030,121,231** | **3,031,013,880** |

## 11. සංචාරක සංවර්ධන බද්දෙන් භාණ්ඩාගාරය වෙත 0.5% ක ප්‍රේෂණය

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| සංචාරක සංවර්ධන බද්දෙන් භාණ්ඩාගාරය වෙත 0.5% ක ප්‍රේෂණය | 3,096,305 | - |
| **එකතුව** | **3,096,305** | - |

**සටහන**

2003 අංක 25 දරන මූල්‍ය පනතේ II වන කොටසේ සංශෝධනය ප්‍රකාරව, 2019 ජනවාරි 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂික පිරිවැටුම මිලියන 120 අඩු ව්‍යාපාරිකයින්ගේ පිරිවැටුම මත සංචාරක සංවර්ධන බද්ද අය කෙරේ.


2020 වර්ෂය තුළ සංචාරක සංවර්ධන බද්දෙන් 0.5%ක් ලෙස රුපියල් 3,096,305ක් එකතු කර ඇත.

## 12. සංචාරක සංවර්ධන බදු සහ අපගමන බදු

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| 2020 වර්ෂය තුළ මුළු සංචාරක සංවර්ධන බදු | 478,724,505 | 1,313,607,842 |
| 2020 වර්ෂය තුළ අපගමන බදු | 420,330,943 | 2,557,605,243 |
| **එකතුව** | **899,055,449** | **3,871,213,085** |

## 13. බෙදා හැරීම

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| බෙදා හැරීම | 809,709,592 | 4,129,128,767 |
| **එකතුව** | **809,709,592** | **4,129,128,767** |



**SRI LANKA TOURISM DEVELOPMENT FUND**
No. 80, Galle Road, Colombo 03
Tel : +94 112426800 / +94 112426900 / 2437055/59/60
Fax : +94 112 444165 / 2426984
Email : info@srilanka.travel